# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2422/16 – 2025 පෙබරවාරි මස 04 වැනි අඟහරුවාදා – 2025.02.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1992 අංක 59 දරන සත්ව රෝග පනත**

5 වන වගන්තියේ කරනු ලබන නියමය හා ඊට ආනුෂාංගික විධිවිධාන

2024 නොවැම්බර් මස 04 දින පළ කරන ලද අංක 2409/02 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ 5 වන වගන්තිය අනුව කරනු ලබන නියමය හා ඊට ආනුෂාංගික විධිවිධාන පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරමි.

1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ පළමු වන උපලේඛනයේ සඳහන් සංස්පර්ශක රෝගයක් වන අප්‍රිකානු සූකර උණ රෝගය (AFS) සහ 2014 ජුනි මස 17 වන දින හා අංක 1867/8 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* සඳහන් වන අභිජනන හා ශ්වසන සහලක්ෂණ රෝගය ( PRRS) ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පැතිරී ගිය බැවින් හා තවදුරටත් පැතිරීමට ඉඩ ඇති බැවින්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කස්තුරි ආරච්චිගේ චන්ද්‍රිකා හේමාලි අබේරත්න කොතලාවල වන මා එම පනතෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව,

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එම පනතේ කාර්යය සඳහා අප්‍රිකානු සූකර උණ රෝගය (AFS) සහ අභිජනන හා ශ්වසන සහලක්ෂණ රෝගය ( PRRS) සඳහා ආසාධිත හෝ අවදානම් ප්‍රදේශයන් ලෙස ද,

(1) ඌරන් රෝග අවදානම් සතුන් ලෙස ද,

මෙම නියමයෙන් තවදුරටත් ප්‍රකාශයට පත් කරමි.

(2) මෙම නියමය, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක වන අතර, කලින් ඉවත් කළ හොත් මිස හෝ එම පනතේ 5(3) වගන්තිය අනුව වලංගු කාලය දීර්ඝ කළහොත් මිස ක්‍රියාත්මක වන දින සිට මාස 03කට නොවැඩි කාලයක් සඳහා වලංගු වන අතර රෝග තත්වය අනුව කාලය දීර්ඝ කිරීමේ හැකියාව ඇත.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. මෙම නියමය වලංගුව පවතින කාලය තුළ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන මා,

(1) ඇති වී තිබෙන අප්‍රිකානු සූකර උණ රෝගය (AFS) සහ සූකර අභිජනන හා ශ්වසන සහලක්ෂණ රෝගය ( PRRS) ආසාධිත හා අවදානම් ප්‍රදේශයට සීමා කිරීම සඳහා හා පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා අවශ්‍ය වන පහත සඳහන් ක්‍රියා හා කටයුතු මෙයින් තහනම් කරමි.

I. සත්ත්ව රෝග පනතේ 5 (4) වගන්තිය යටතේ සියලුම අවදානම් සහිත ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හෝ රෝග කාරක ද්‍රව්‍ය, 1999 දෙසැම්බර් 03 දින අංක 1108/23 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝගයේ VI ආකෘතියට අනුකූලව ප්‍රදේශය භාර බලයලත් පශු වෛද්‍ය නිලධාරිවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකින් තොරව අසාදිත ප්‍රදේශය තුළ හෝ ඉන් පිටතට ප්‍රවාහනය කිරීම, ඉවත් කිරීම, රැගෙන යාම හෝ පලවා හැරීම.

II. ආසාධිත සතුන් මස් පිණිස ඝාතනය කිරීම, ( ආසාධිත නොවන බවට බලයලත් නිලධාරියෙකු විසින් සිදු කරන පරීක්ෂණ මගින් තහවුරු කර ගත යුතු වේ.)

III. සියළුම සූකර මස් සැකසුම් මධ්‍යස්ථානවල ඒ ඒ සත්ව කාණ්ඩවලට අදාළ සත්ව සෞඛ්‍ය සහතිකවල පිටපත් තබා ගත යුතු වේ.

IV. අවදානම් සතුන් භාවිතා කොට ගෙන සජීවී සත්ත්ව වෙළෙඳ පොල පැවැත්වීම.

V. මෙම නියෝගයේ නම් කරන ලද බලයලත් නිලධාරියෙකුගේ අවසර පත්‍රයක් නොමැතිව ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හා රෝග කාරක ද්‍රව්‍ය විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම සහ ඌරු මස්වලින් නිෂ්පාදන සකස් කිරීම.

VI. අදාළ රෝග හේතුවෙන් මරුමුවට පත්වූවා හෝ ආසාධිත වූවායැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් හෝ වෙනත් කිසියම් අවදානමට ලක් වූ ද්‍රව්‍යය ජලය සම්බන්ධ කිසිදු ස්ථානයකට දැමීම.

VII. අදාළ රෝගයන් හේතුවෙන් මරුමුවට පත්වූවා හෝ ආසාධිත වූවායැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් වෙනත් සතුන් විසින් වෙනත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ රැගෙන යාමට හැකි පරිදි යම් ස්ථානයක දැමීම හෝ ස්ථානගත කිරීම.

VIII. මෙම නියෝගයේ නම් කරන ලද බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කරන ලද ඝාතකාගාරයක හැර අනෙකුත් ඝාතකාගාරයක මස් පිණිස ඌරන් ඝාතනය කිරීම.

03. ආසාධිත නොවූ අභිජනන ගොවිපළවල සිටින සතුන් අභිජනනය කිරීම හා විකිණීම පහත සඳහන් නිර්නායක මත පදනම්ව අවසර දෙමි :

I. අභිජනන ගොවිපල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ව අභිජනන අංශයේ ලියාපදිංචි අභිජනන ගොවිපළක් විය යුතුය.

II. අභිජනනය සඳහා යොදා ගන්නා සියළුම සතුන්, තර කිරීම/අභිජනනය සඳහා අලෙවිකරණ සතුන් හා ඝාතනය කරන සතුන් මෙම රෝග සඳහා අසාධිත නොවන බවට බලයලත් නිලධාරියකු විසින් පරික්ෂාවකින් තහවුරු කර ගත යුතු වේ.

III. වාණිජ ගොවිපල වෙත නිකුත් කරන පැටව් ද ඉහත II හි ආකාරයට බලයලත් නිලධාරියකු මගින් තහවුරු කරගත යුතුවේ.

IV. සතුන් අළුතින් ඇතුල් කර ආරම්භ කිරීමට අපේක්ෂිත වාණිජ ගොවිපල මනාලෙස විෂබීජහරණය වී ඇති බවටත්, ජෛව ආරක්ෂණ ක්‍රමවේද ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව පවත්වාගෙන යන බවටත් බලයලත් නිලධාරියකු මගින් තහවුරු කරගත යුතුවේ.

V. මිලදී ගන්නා/ ලබා ගන්නා ලද සතුන්ගේ ප්‍රවාහනය සඳහා ලබාදුන් සත්ව සෞඛ්‍ය සහතිකවල පිටපතක් සැමවිටම ගොවිපල තුළ තබා ගත යුතුවේ.

04. සත්ව රෝග පනත මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,

(1) එම පනතේ 3 (3) උපවගන්තිය අනුව සහ මෙම නියෝගයේ 2 (1) ඡේදයේ තහනම් කරන ලද ක්‍රියා සිදුකිරීම වැළැක්වීම සඳහා ද ඒ වෙනුවෙන් එම පනතේ 13 සහ 14 වගන්තීන්වල සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද පහත සඳහන් නිලධාරීන් බලයලත් නිලධාරීන් ලෙස නම් කරමි.

I. අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
II. අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
III. ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරීන්, මහනගර සභා
IV. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
V. සියලුම පළාත් අධ්‍යක්ෂකවරුන් - පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
VI. විෂයානුබද්ධ විශේෂඥ - පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
VII. දිස්ත්‍රික් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සියලුම දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරිවරු
VIII. දිස්ත්‍රික්ක භාර පශු විමර්ශන නිලධාරීන්
IX. සියලුම කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන්
X. සියලුම නාගරික පශු වෛද්‍ය නිලධාරීන්
XI. සියලුම වනජීවී පශු වෛද්‍ය නිලධාරීන්

කස්තුරි ආරච්චිගේ චන්ද්‍රිකා හේමාලි අබේරත්න කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2025 පෙබරවාරි මස 04 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ,
පේරාදෙණිය.

EOG 02- 0029

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.